## වීරකැටිය ප්‍රාදේශීය සභාව
## මාසික සභා රැස්වීම - 2023 පෙබරවාරි 16

වර්ෂ 2023 ක් වූ පෙබරවාරි මස 16 වන දින පෙරවරු 10.00 ට වීරකැටිය ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරයේදී පැවති 06 වැනි සැසි වාරයේ 59 වැනි මාසික සභා රැස්වීමේ ලුහුඬු වාර්තාවයි.

පැමිණීම :-

1. පියසේන ලියනආරච්චි - ගරු සභාපති
2. චරාණේත ලියනගේ අනුර ද අල්විස් - ගරු උප සභාපති
3. ලියනපතිරණගේ සිරිසේන - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
4. මුණසිංහ ලියනආරච්චිගේ රංජිත් - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
5. රණවීර ආරච්චිගේ ආරියරත්න - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
6. කලංචිගේ රංජිත් තුංග - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
7. බැදිගම කපුගේ චන්ද්‍රසේන - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
8. ගමගේ සරත් කුමාර සිරි - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
9. විජමුණිගේ රණතුංග - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
10. චමින්ත ක්‍රිශාන්ත කුමාර ලියනආරච්චිගේ - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
11. රාමනායකගේ අරුණසිරි - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
12. රණවීර ගමගේ සෝමාවති - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
13. ජයවික්‍රම ආරච්චිගේ සන්ධ්‍යා ශ්‍රියානි - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
14. මුණසිංහ ආරච්චිගේ ශ්‍රියාණි - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
15. දඩල්ලගේ දයාවති - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
16. විජමුනිගේ දර්ශන සම්පත් කුමාර - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
17. විජමුනි දූරගේ රත්නපාල - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
18. කොඩිකාරගේ වත්සලා මධුෂානි කොඩිකාර - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
19. මහතුංගේ ගුණරත්න - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
20. පල්ලිය ගුරුගෙයි දොන් ලක්ෂ්මන් චන්ද්‍රරත්න අබේවර්ධන - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
21. ලියනආරච්චිගේ චන්ද්‍රදාස - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
22. වැටිය විදානගමගේ චම්පා නිල්මිණී - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
23. නානායක්කාර වසන් අප්පුගේ ගීතිකා කවුන්දරී හේමාලී - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
24. ජයසිං බෝල්ප ගමගේ චාමිකා ක්‍රිශාන්ති - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
25. කංකානම්ගේ මිලාන් මධුවන්ත - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
26. ලියන ආරච්චිගේ නාලක හේමන්ත - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
27. දෙවුන්දර සිත්තර බඩල්ගේ විපුලසේන - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
28. හේවා ගම්මැද්දගේ ඉන්දික කුමාර - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
29. හේවාගමගේ සුරංග පුෂ්පකුමාර - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
30. දහනායක සේපාල - ගරු ප්‍රා.ස. මන්ත්‍රී

නොපැමිණීම :-

1. ගුණතිලක ජයසේකර - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
2. පද්මල් රුබසිංහ - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
3. චමල් ප්‍රදීප් කුමාර හෙට්ටිආරච්චි - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
4. ආයිත්තප්පුලිගේ චාමර මිහිරංග - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
5. නිමල් දොන් ෆ්‍රැන්සිස්කු - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
6. මදුරසිංහගේ සුමනසේන - ගරු ප්‍රා.ස. මන්ත්‍රී

මූලාසනය :- ගරු සභාපති පියසේන ලියනආරච්චි මහතා

අද දින සභා රැස්වීම සඳහා විරකැටිය ප්‍රාදේශිය සභාවේ ලේකම් ජී.ඒ. නදීකා දිල්හානි මහත්මිය සහභාගී විය.

**පිළිගැනීම :-**

ගරු සභාපති පියසේන ලියනආරච්චි මහතා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්යාලයේ නිලධාරී මණ්ඩලය සහ මාධ්‍යවේදී මහතා ඇතුලු සියලු දෙනාම ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගන්නා ලදී.

**ආගම සිහිකිරීම :-**

සියලු දෙනාම තිසරණ සහිත පංචශීලය සමාදන් විය.

**ජාතික ගීය ගායනා කිරීම :-**

සියලු දෙනාම එක්ව ජාතික ගීය ගායනා කරන ලදී.

**රට ජාතිය වෙනුවෙන් කැපවුණු සියලු විරුවන් වෙනුවෙන් විනාඩි 2 ක නිශ්ශබ්දතාවය රැකීම :-**

රැස්ව සිටි පිරිස විනාඩි 02 ක නිශ්ශබ්දතාවය පළ කරන ලදී.

**නිවාඩු අනුමත කිරීම :-**

ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා, ගරු ප්‍රා.ස. මන්ත්‍රී පද්මල් රූබසිංහ මහතා, ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමල් ප්‍රදීප් කුමාර හෙට්ටිආරච්චි මහතා, ගරු ප්‍රා.ස. මන්ත්‍රී ආයිත්තප්පුලිගේ චාමර මිහිරංග මහතා, ගරු ප්‍රා.ස. මන්ත්‍රී නිමල් දොන් ෆ්‍රැන්සිස්කු මහතා සහ ගරු ප්‍රා.ස. මන්ත්‍රී මැදරසිංහගේ සුමනසේන මහතා අද දින සභාවට නොපැමිණෙන බව මා වෙත වාර්තා කර ඇති බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

ඒ අනුව එම මන්ත්‍රීතුමන්ලාට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී තාලක ලියනආරච්චි මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී අරුණසිරි රාමනායක මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

**01. පසුගිය රැස්වීමේ වාර්තාව අනුමත කිරීම :-**

පසුගිය මාසික සභා රැස්වීමේ න්‍යාය පත්‍රයත් සමග සභා වාර්තාව සියලු මන්ත්‍රීතුමන්ලාට ලැබෙන්නට සලස්වා ඇති බැවින්, කියවා සංශෝධන ඇතොත් එම සංශෝධන ඉදිරිපත් කරන ලෙසත්, එසේ සංශෝධන නොමැති නම් සංශෝධන නොමැති සේ සලකා සභා සම්මත කරන ලෙසත්, ගරු සභාපතිතුමා විසින් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.

ඒ අනුව පසුගිය මාසික සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

**02. මූලාසනයේ විශේෂ නිවේදන :-**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සියලුම දෙනා මැතිවරණයට සූදානම් වී ඇති බවත්, දැනට සිටින සියලු දෙනා ඉතාම සහෝදරත්වයෙන් කටයුතු කරන ලද බවයි. නමුත්, මැතිවරණයට සූදානම් වී සිටින නවක අපේක්ෂකයින් ඉතාම වෙනස් පුද්ගලයන්ය. සියලු දෙනාම සාමූහිකව මැතිවරණයට සූදානම් විය යුතුය. එකිනෙකාට වෛර කරමින් ගම්වාසීන් අතර පවතින සුහදතාවය නැති කරමින් කටයුතු නොකර සියලු දෙනාම සහෝදරත්වයෙන් සාමූහිකව මැතිවරණය කළ යුතුය. ගම්වාසීන් සියලුම කාරණා වලදී ඒකරාශීව කටයුතු කරන අතර, නමුත් මැතිවරණ අවස්ථාවේදී පමණක් ජනතාව එකිනෙකාට වෛර කරමින් කිසිදු සහයෝගයක් නොමැතිව ක්‍රියා කරන ආකාරයක් පෙනී යයි. අපේක්ෂකයන් විසින් ජනතාව වැරදි සහගත ලෙස පොළඹවා ජනතාව අතර වෛරයක් ඇති කර ඇත. ජනතාවට මත්ද්‍රව්‍ය ලබාදී කරන දේශපාලනයක් සමහර ස්ථානවල පවත්වාගෙන යන අතර, සියලු දෙනා ඉතාම ඉවසීමෙන් කටයුතු කරන ලෙස සියලු දෙනාගෙන් ඉල්ලා සිටින ලදී.

**03. සංදේශ, පෙත්සම්, පැමිණිලි සහ ආයාචනා සභාගත කිරීම :-**

## 04. කාරක සහා වාර්තා :-

**4.1** මුදල් කමිටුව :

2023.02.07 දින පැවති මුදල් කමිටු වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. මුදල් කමිටු වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩබ්.එම්. රණතුංග මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී බී.කේ. චන්ද්‍රසේන මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සහා සම්මත විය.

**4.2** කාර්මාන්ත කමිටුව : නැත

**4.3** සංවර්ධන හා උපදේශන කමිටුව : නැත

**4.4** පරිසර කමිටුව : නැත

**4.5** නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව : නැත

## 05. සභාවේ ආදායම් සහ වියදම් වාර්තා සහ ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම :-

<u>ඒකාබද්ධ වැය සාරාංශය - 2022 දෙසැම්බර් මාසය</u>

| | |
|---|---:|
| වැටුප් හා දීමනා | 6446351.64 |
| ගමන් වියදම් | 296810.00 |
| සැපයුම් හා උපකරණ | 4146268.40 |
| ප්‍රාග්ධන වත්කම් අ.වැ.හා නඩත්තුව | 843785.83 |
| ප්‍රවාහන සම්බන්ධතා ආවශ්‍යක සේවා | 945929.21 |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 79206.72 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 387191.69 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 115354.06 |
| පුනරාවර්තන වියදම්වල එකතුව | 13260897.55 |
| ප්‍රාග්ධන වැය | 3898001.20 |
| ණය ආපසු ගෙවීම | 410370.05 |
| ප්‍රාග්ධන වැය එකතුව | 4308371.25 |
| මාසයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් එකතුව | **17569268.80** |
| විවිධ ණය හිමියෝ | 23768870.94 |
| අත්තිකාරම් | 76050.00 |
| තැන්පත් | 5282017.45 |
| සේවක ණය | 1000000.00 |
| ණය ගැති | - |
| අතිරික්ත/ඌණතා/වෙනත් (ගිණුම් අතර මුදල් මාරු) | 2638700.00 |
| **මාසයේ මුළු ගෙවීම් එකතුව** | **50334907.19** |

<u>ඒකාබද්ධ ලැබීම් සාරාංශය - 2022 දෙසැම්බර් මාසය</u>

| | |
|---|---:|
| වරිපනම් හා බදු | 331060.08 |
| කුලී | 7068777.82 |
| බලපත්‍ර ගාස්තු | 627140.00 |
| සේවා සඳහා ගාස්තු | 257620.00 |
| වරෙන්තු ගාස්තු | 1081560.11 |
| වෙනත් ආදායම් | 208286.35 |
| වෙනත් ආධාර | 4638884.55 |
| පුනරාවර්තන ආදායම් එකතුව | 14213328.91 |
| මූලධන ලැබීම් | - |
| පුනරාවර්තන හා ප්‍රා. ආදායම්වල මුළු එකතුව | **14213328.91** |
| සේවක ණය | 873742.02 |
| තැන්පත් | 4965817.83 |
| අත්තිකාරම් | 694409.00 |
| විවිධ ණය ගැති | 132806.70 |

| | |
|---|---|
| ආදායම් හා වෙනත් ලැබීම් (විවිධ නයගැනි) | 27689.75 |
| **මුළු එකතුව** | **20907794.21** |

*හිඟ ආදායම් විස්තර - 2022 දෙසැම්බර් මාසය*

| | |
|---|---|
| වරිපනම් හා බදු | 4981222.32 |
| කර්මාන්ත | 31500.00 |
| ව්‍යාපාර බදු | 530800.00 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | 80750.00 |
| රථවාහන නැවතුම් | 135670.08 |
| කඩ කාමර කුලී | 150850.00 |
| පොළ බදු | 8263067.21 |
| අක්කර බදු | 32375.22 |
| දැන්වීම් පුවරු | - |
| උසාවි දඩ | 2927353.00 |
| මුද්දර ගාස්තු | 7727107.00 |
| විවිධ පහන් | 263640.00 |
| යන්ත්‍ර කුලී | - |
| එකතුව | **25124234.83** |

ලැබීම් සහ ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ සහ හිඟ ආදායම් විස්තර සත්‍ය විස්තර ඇතුලත් වාර්තා සත්‍ය වාර්තා වන බැවින්, එම වාර්තා සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ජේ.ඒ. සන්ධ්‍යා ශ්‍රියාණි මහත්මිය විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමින් ලියනආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

**06.** කල් දෙනු ලැබූ ප්‍රශ්න :- නැත

**07.** කල් දෙනු ලැබූ යෝජනා :-

07.1 පැණිවිටත්ත නව ගම්මානය සඳහා පානීය ජලය ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. මෙම ගම්මානයේ පවුල් 80 ක් පමණ ජීවත් වන අතර, එම ගම්වාසීන්ට පානීය ජලය නොමැතිවීමේ ගැටලුව වසර 03 කටත් වැඩි කාලයක පමණ සිට පවතින ගැටලුවකි. ගම්වාසීන් විසින් දැනට පානීය ජලය ලබාගන්නේ ගල් වළකින් වන අතර, එම ගම්මානයට පානීය ජලය ලබාගැනීම සඳහා වන රු. 1182880.25 ක ඇස්තමේන්තුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් එවා ඇත.

ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩබ්.ඩී. රත්නපාල මහතා අදහස් දක්වමින් පවසා සිටියේ මෙම ගම්මානයේ විශාල ප්‍රමාණයක් ජීවත්වන අතර, පානීය ජලය නොමැතිවීම ප්‍රධාන ගැටලුවක් වී ඇති බවයි. එම නිසා පල්ලෙමුලන පැණිවිටත්ත නව ගම්මානයට පානීය ජලය ලබාදීම සඳහා වන රු. 1182880.25 ක මුදල සභා අරමුදලින් ගෙවීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩබ්.ඩී. රත්නපාල මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ජේ.ඒ. සන්ධ්‍යා ශ්‍රියාණි මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව පල්ලෙමුලන පැණිවිටත්ත නව ගම්මානයට පානීය ජලය ලබාදීම සඳහා වන රු. 1182880.25 ක මුදල සභා අරමුදලින් ගෙවීම සුදුසු බවට කරන ලද යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07.2 පුස්තකාල සාමාජිකයන්ට සිදුවන අපහසුතා මගහැරගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. පුස්තකාල සාමාජිකත්වය ලබාගැනීමේදී පුස්තකාල සාමාජිකත්ව අයදුම්පත්‍ර කාර්යාලයෙන් ලබාගැනීමට සිදුවී ඇති අතර, නමුත් සතියේ දින 05 පමණක් කාර්යාලය විවෘතව තබන බැවින්, නිවාඩු දිනයන්හිදී පුස්තකාල සාමාජිකත්ව අයදුම්පත්‍ර ලබාගැනීමේ ගැටලුවක් පවතී. පුස්තකාලය මගින් අයදුම්පත්‍ර ලබාගැනීමට අවස්ථාව ලබාදීම තුලින් මෙම ගැටලුව මගහරවා ගත හැකි බව පුස්තකාලභාර නිලධාරී විසින් දන්වා ඇත.

ඒ අනුව පුස්තකාල සාමාජිකත්ව අයදුම්පත්‍රය පමණක් සතියේ දින 07 සඳහා ගාස්තු අයකිරීමකින් තොරව මහජන පුස්තකාල දෙක මගින් ලබාදීමටත්, වර්තමානයේ පොත් වල අලෙවි මිල ඉතා ඉහල මට්ටමක පවතින බැවින්, දැනට මහජන පුස්තකාල සාමාජිකත්වය සඳහා ලබාගන්නා රු. 100/- ක සාමාජික මුදල වෙනුවට පාසල් සාමාජිකයන්ගෙන් රු. 200/- ක් හා අනෙකුත් සාමාජිකයන්ගෙන් රු. 300/- ක ගාස්තුවක් අයකිරීමටත්, සාමාජිකත්වය අලුත් කිරීම ගාස්තු අයකිරීමකින් තොරව සිදුකිරීමටත්, පාඨකයන් ගෙන යන පොත් රඳවා ගැනීම අධෛර්යමත් කිරීම සඳහා නියමිත දිනට පොත් ගෙන්වා ගැනීමේ ක්‍රමවේදයක් වශයෙන් රඳවා තබාගන්නා සෑම පොතක්

වෙනුවෙන් එක් දිනක් සඳහා රුපියලක් ලෙස පැවති දඩ මුදල රු. 5/- ක් ලෙස සංශෝධනය කිරීමටත්, සාමාජික අයදුම්පත්‍රයේ අනවශ්‍ය කොටස් ඉවත් කර සංශෝධනය කිරීමටත්, සියලුම සාමාජිකයන් සඳහා ගාස්තු අයකිරීමකින් තොරව වසරකට වරක් සාමාජිකත්වය අලුත් කිරීමටත් එහිදී තොරතුරු වෙනස් නොවන සාමාජිකයින් සාමාජිකත්වය අලුත් කිරීමේ අයදුම්පත්‍රය භාරකරු / අධීක්ෂණ නිලධාරී නිර්දේශය යටතේ අදාල මහජන පුස්තකාලය වෙත භාරදීමටත් තොරතුරු වෙනස් වන සාමාජිකයින් නැවත සාමාජික ගාස්තු ගෙවීමකින් තොරව පෙර පරිදි සාමාජිකත්වය ලබාගැනීමටත්, සාමාජිකත්වය මගින් අස්ථානගත කරන / භාර නොදෙන / විනාශ කරන සෑම පොතක් සඳහාම ඒ පිළිබඳ දැනුම් දීමේ ලිපිය සමග අදාල පොතෙහි වටිනාකම අදාල ප්‍රකාශන ආයතනය මගින් ලබාගැනීම හෝ එසේ නොහැකි පොත් සඳහා ලේඛනගත වටිනාකම සමග අදාල පොතේ වටිනාකම මෙන් 25% ක මුදලක් සහ ප්‍රවාහන වියදම් ඇතුලත්ව ආයතනය තක්සේරු කරන මුදල අයකිරීමත් සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී නාලක ලියනආරච්චි මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සහා සම්මත විය.

07.3 විද්‍යුත් පුස්තකාලයේ ගැටලු සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. මහජන පුස්තකාලයේ කෙළවරක විද්‍යුත් පුස්තකාලය පිහිටා තිබෙන අතර, විද්‍යුත් පුස්තකාලය පරිහරණය කරන්නන් මහජන පුස්තකාලය හරහා ගමන් කිරීම නිසා විද්‍යුත් පුස්තකාලය තුළ නිශ්ශබ්දව හැසිරීමට නොහැකි අතර, එහි ශබ්දය පිටතට පැමිණීම මහජන පුස්තකාලයට බාධාවකි. මහජන පුස්තකාලය තුළ පවතින අධික රස්නය සහ දූවිල්ල හේතුවෙන් විද්‍යුත් පුස්තකාලයේ පරිශීලකයන් අපහසුතාවයට පත්වන අතර, පරිගණකවල දිගුකාලීන පැවැත්ම නැති වීමටද හේතුවේ. විද්‍යුත් පුස්තකාලයේ සාමාජික සංඛ්‍යාව වැඩිකර ගැනීම සඳහා පාසල් ළමුන්ට සහ පරිගණක විෂය සඳහා උනන්දුවක් දක්වන සාමාජිකයන්ට පරිගණක දැනුම ලබාදීමට අපේක්ෂා කරන බවත්, එසේම ඒ සඳහා දැනට බාහිර ආයතන මගින් මාසිකව රු. 800/- ක මුදලක් අයකරන බවත් පුස්තකාල භාරකරු විසින් දන්වා ඇත.

විද්‍යුත් පුස්තකාලය සඳහා වෙන්කර ඇති කොටස ප්‍රමාණවත් නොවන බැවින්, ඒ සඳහා කාර්යාල ගොඩනැගිල්ලේ තෙවන මහලේ බස්නාහිර දෙසට පිහිටා තිබෙන කාමරය සුදුසු බව තාක්ෂණ නිලධාරී මහතා විසින් නිර්දේශ කර ඇත.

ඒ අනුව කාර්යාලීය ගොඩනැගිල්ලේ තෙවන මහලේ බස්නාහිර දෙසට පිහිටා තිබෙන කාමරයේ විද්‍යුත් පුස්තකාලය ස්ථාපිත කිරීමත්, එම කාමරය සකස් කිරීම සඳහා අවශ්‍ය විදුලි උපාංග මිලදී ගැනීම හා අන්තර්ජාල සම්බන්ධතාවයන් ලබාගැනීම සහ උපකරණ ස්ථානගත කිරීම සඳහා සභා අරමුදලින් වියදම් දැරීමත්, පරිගණක විෂය හදාරන දරුවන් සඳහා එම දැනුම ලබාදීම වෙනුවෙන් දෛනිකව රු. 100/- ක ගාස්තුවක් අයකිරීමත් සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී නාලක ලියනආරච්චි මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සහා සම්මත විය.

07.4 2022.12.31 දිනට ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ඒ අනුව 2022.12.31 දිනට ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාව අනුමත කිරීම හා එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ජේ.ඒ. සන්ධ්‍යා ශ්‍රියාණි මහත්මිය මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සහා සම්මත විය.

07.5 2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ඒ අනුව 2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමත කිරීම හා එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමත්, කාර්යාල ගොඩනැගිල්ලෙන් පිටත ඇති සියලුම භාණ්ඩ වල වගකීම ලේඛනයක් මගින් මුරකරුවන්ට භාරදීමත් සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී බී.කේ. චන්ද්‍රසේන මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සහා සම්මත විය.

07.6 ඵලදායිතා සංකල්පය ඉහල නැංවීමේ අරමුණින් හෙළ බොජුන් හලෙහි නාම පුවරු සකස් කිරීම හා ආයතනයෙහි ප්‍රධාන නාම පුවරුව අලුත්වැඩියා කිරීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. හෙළ බොජුන් හල සංකල්පය සහ එහි ආකෘතින් මේ වන විට ජනගත වී ඇති අතර, වීරකැටිය ප්‍රාදේශීය සභාව මගින් කරගෙන යනු ලබන "රුහුණු රස හෙළ බොජුන්" හල හෙළ බොජුන් සංකල්පය සහ ජන කොටසේ අවශ්‍යතාවය විශ්ලේෂණය කරගනිමින් හෙළ බොජුන් සංකල්පයෙන් ඔබ්බට ගිය නිර්මාණයක් ලෙස හඳුනාගෙන ඇති බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය විසින් ලිපියක් මගින් දන්වා එවා ඇත. එසේම ඒ පිළිබඳව ජාතික රූපවාහිනී වැඩසටහනක් ද 2023 පෙබරවාරි 27 සහ 28 දිනයන්හි පැවැත්වීමට එම ආයතනය මගින්

සූදානම් කර ඇත. එම ස්ථානයේ සේවාව විධිමත් කිරීමට ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා නාම පුවරු ප්‍රදර්ශනය කළ යුතුව ඇත. එසේම ප්‍රධාන කාර්යාලයේ නාම පුවරුවේ අකුරු ගැලවී ඇත. එසේම රූපවාහිනී විඩියෝ වැඩසටහන සඳහා පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් පැමිණෙන නිලධාරීන්ට ඉහත දෙදින සඳහා අවශ්‍ය ආහාරපාන ලබාදිය යුතුය.

ඒ අනුව රු. 200000/- නොවැඩි ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන මගින් පොළ බොජුන් හලෙහි නාම පුවරු සකස් කිරීම හා ආයතනයෙහි ප්‍රධාන නාම පුවරුව අලුත්වැඩියා කිරීමත්, ජාතික රූපවාහිනී වැඩසටහන සඳහා පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් පැමිණෙන නිලධාරීන්ට ආහාරපාන ලබාදීම සඳහා සභා අරමුදලින් වියදම් දැරීමත් සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ජේ.ඒ. සන්ධ්‍යා ශ්‍රියාණි මහත්මිය විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.7 වීරකැටිය පොළ භූමියේ දෙමහල් ගොඩනැගිල්ලේ දෙවන මහල කී මනී ක්‍රමයට කඩිනමින් ඉදිකිරීමට ලබාදීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. වීරකැටිය පොදු වෙළඳපොළ අසල ගොඩනැගිල්ලෙහි බිම් මහල පමණක් සකස් කර ඇති අතර, වර්ෂා කාලයේදී එම කඩ කාමර තුලට වැටෙන ජලය නිසා වෙළඳුන් විශාල අපහසුතාවයකට පත්වී ඇති බව වෙළඳුන් විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත. මෙම ගැටලුකාරී තත්වය මගහරවා ගැනීමට නම් දෙවන මහලේ වහලය සකස් කළ යුතුය. නමුත්, ඒ සඳහා සභාව මගින් මුදල් වියදම් කිරීමට හැකියාවක් නොමැත. එම නිසා කිසියම් පුද්ගලයෙකුට කී මනී ක්‍රමයට දෙවන මහල කඩිනමින් ඉදිකිරීමට ලබාදීම සුදුසුය.

කී මනී ක්‍රමයට ලබාදීමේදී බිම් මහල කඩ කාමරයේ බදු අයිතිය හිමි පුද්ගලයාගේ කැමැත්ත පරිදි දෙවන මහලේ ඉදිකිරීම් කිරීමට එම පුද්ගලයාටම අවස්ථාව ලබාදීම සුදුසු බව ගරු ප්‍රා.ස. මන්ත්‍රී චන්ද්‍රදාස ලියනආරච්චි මහතා විසින් පවසන ලදි.

ඒ අනුව වීරකැටිය පොළ භූමියේ දෙමහල් ගොඩනැගිල්ලේ දෙවන මහල කී මනී ක්‍රමයට කඩිනමින් ඉදිකිරීමට ලබාදීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ජේ.ඒ. සන්ධ්‍යා ශ්‍රියාණි මහත්මිය විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ආර්.ජී. සෝමාවතී මහත්මිය විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.8 පළාත් පාලන අමාත්‍යාංශය මගින් එවා ඇති දැනට පළාත් පාලන ආයතන තුළ භාවිතයට නොගන්නා ගොඩනැගිලි භාවිතා කර වැඩිහිටියන් සඳහා දිවා කාලයේ විවේකීව ගතකිරීමට සුදුසු ස්ථානයක් සකස් කිරීමට මුදල් ලබාදීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. සභාව සතු අබලන් තත්වයේ පවතින ගොඩනැගිලි මේ සඳහා භාවිතා කරගන්නා ලෙස දන්වා ඇත. සභාව සතු වලස්මුල්ල ඔයගාවත්ත ලිපිනයේ ඇති අබලන් තත්වයේ පවතින වැඩිහිටි නිවාසය සඳහා ඉදිකර අඩක් නිමකර ඇති ගොඩනැගිල්ල අලුත්වැඩියා කර සකස් කිරීම සුදුසුය.

ඒ අනුව සභාව සතු වලස්මුල්ල ඔයගාවත්ත වැඩිහිටි නිවාසය අලුත්වැඩියා කර වැඩිහිටියන් සඳහා දිවා කාලයේ විවේකීව ගතකිරීමට සුදුසු ස්ථානයක් බවට පත්කිරීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී බී.කේ. චන්ද්‍රසේන මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ. පිලාන් මධුවන්ත මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.9 දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් එවා ඇති බහුකාර්ය සංවර්ධන සහායකයින් සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය අනුව බහුකාර්ය සංවර්ධන නිලධාරීන් රාජ්‍ය සේවයේ (පළාත් පාලන සේවයට ද ඇතුළුව) පුරප්පාඩු සඳහා ස්ථිරව බඳවා ගැනීම සඳහා එකඟතාවය ලබාදෙන ලෙස එම ලිපිය මගින් දන්වා ඇත. ඒ සඳහා 2023 වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණය කිරීමට හැකියාවක් නොපවතින අතර, සභාවේ දැනට සේවයේ යෙදී සිටින අනියම් සේවකයන් ස්ථිර කිරීමකින් තොරව අප සභාවේ පවතින පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන සහායකයින් ස්ථිරව බඳවා ගැනීමට එකඟතාවය පළකිරීමට හැකියාවක් නොමැත.

ඒ අනුව 2023 වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණය කිරීමට හැකියාවක් නොපවතින නිසාත්, සභාවේ දැනට සේවයේ යෙදී සිටින අනියම් සේවකයන් ස්ථිර කිරීමකින් තොරව අප සභාවේ පවතින පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන සහායකයින් ස්ථිරව බඳවා ගැනීම සුදුසු නොවන බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ජේ.ඒ. සන්ධ්‍යා ශ්‍රියාණි මහත්මිය විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ශ්‍රියාණි මුණසිංහ මහත්මිය විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.10 වීරකැටිය සති පොළ අංක 05 කඩ කාමර කුලී ගෙවීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. මෙම කඩ කාමරය සඳහා 2022 වර්ෂයේ කිසිදු මුදලක් ගෙවා නොමැත. පසුගිය සභා වාරයකදී මෙම අංක 05 කඩ කාමරය සඳහා දඩ පොලිය කපා හැර බදු මුදල පමණක් ගෙවීම සඳහා සහනයක් ද ලබාදෙන ලදි. නමුත්, එම මුදල් මේ වන තෙක් ගෙවා නොමැත. අවස්ථා කිහිපයකදීම දැනුවත් කළද, ඒ පිළිබඳව කිසිදු සැලකිල්ලක් දක්වා නොමැත.

ඒ අනුව වීරකැටිය සති පොළ අංක 05 කඩ කාමරය සඳහා කුලී ගෙවීම සිදුකර නොමැති නිසා මෙම කඩ කාමරය සභාවට පවරා ගැනීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ජේ.ඒ. සන්ධ්‍යා ක්‍රියාණි මහත්මිය විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමල් හෙට්ටිආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.11 නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය මගින් එවා ඇති වලස්මුල්ල නගර සංවර්ධන කටයුතු සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. නගර සංවර්ධනය සිදුකිරීමේදී වලස්මුල්ල සුපර් මාර්කට් භූමියේ එක් කොටසක් ඉවත් කිරීමට තීරණය කර ඇත. සභාවේ දේපලක් ලෙස පවතින එම කොටස ඉවත් කිරීමට පෙර එහි පදිංචිව සිටින ජනතාව එම ස්ථානයෙන් ඉවත් කර නිවාස ඉදිකර ලබාදිය යුතුය. මේ සඳහා සාකච්ඡාවෙන් පසු ක්‍රමවේදයක් යටතේ නිවාස ඉදිකිරීමට නාගරික සංවර්ධන අධිකාරිය මගින් එකඟතාවය පළ කර ඇත. වලස්මුල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධව සවිස්තර වාර්තාවක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ලබාගත යුතු බවත්, එකී වාර්තාව ඉදිරි සභාව වෙත යොමු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් අදහස් දක්වන ලදි.

ඒ අනුව සවිස්තර වාර්තාව නාගරික සංවර්ධන අධිකාරිය මගින් ලැබුණු පසු මේ පිළිබඳව තීරණයකට එළඹීමට සුදුසු බවට ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු ප්‍රා.ස. මන්ත්‍රී වාසිකා ක්‍රිශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.12 වාර්ෂික නිල ඇඳුම් දීමනාව ලබාදීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. තාක්ෂණ සේවා නිලධාරී, රියදුරු, විදුලි කාර්මික, සෞඛ්‍ය කම්කරු, වැඩ ක්ෂේත්‍ර කම්කරු, ආදාහනාගාර ක්‍රියාකරු, මුරකරු, වාහන පවිත්‍රකරු සහ අනියම් බර උපකරණ ක්‍රියාකරු යන තනතුරුවල සේවය කරන සේවකයන්හට වාර්ෂිකව ලබාදෙන නිල ඇඳුම් දීමනාව ලබාගැනීම සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇත. නමුත්, අනියම් බර උපකරණ ක්‍රියාකරු ලෙස සේවය කරන සේවකයාගේ සේවා කාලය වසරකට අඩු බැවින්, "එක් අවුරුද්දක්වත් සේවයේ ඇත්තාවූ" යනුවෙන් ආයතන සංග්‍රහයේ XXI වන පරිච්ඡේදයේ 02 හි සඳහන් කර ඇති පරිදි නිල ඇඳුම් දීමනාව ලබාදිය නොහැකි අතර, එම සේවකයාට වසරක් ගත වූ පසු වාර්ෂික නිල ඇඳුම් දීමනාව ලබාදිය හැකිය.

ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2013, 03/2016 ප්‍රකාරව ඉහතින් සඳහන් කරන ලද සේවකයන්හට වාර්ෂික නිල ඇඳුම් දීමනාව ලබාදීමත්, අනියම් බර උපකරණ ක්‍රියාකරු ලෙස සේවය කරන සේවකයාට වසරක් ගත වූ පසු වාර්ෂික නිල ඇඳුම් දීමනාව ලබාදීමත් සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමින් ලියනආරච්චි මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.ජී. ඉන්දික කුමාර මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.13 බල ප්‍රදේශයේ අත්‍යාවශ්‍ය ස්ථානවලට සිලින්ඩර් යෙදීම සම්බන්ධ රු. 95000/- ක බිල්පත ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ඒ අනුව බල ප්‍රදේශයේ අත්‍යාවශ්‍ය ස්ථානවලට සිලින්ඩර් යෙදීම සම්බන්ධ රු. 95000/- ක බිල්පත ගෙවීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමින් ලියනආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.14 අනියම් පදනමින් සේවයේ නියුතු සේවකයින්ගේ සේවා කාලය දීර්ඝ කිරීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. දෛනික වැටුප් ගෙවීමේ පදනම මත අනියම් පදනමින් ප්‍රාථමික සේවයේ තනතුරු සඳහා යොදවා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය අනුව ලබාගත් අංක 1/3/6/3 හා 2020.07.08, 2021.11.29 දිනැති ලිපි අනුව සෞඛ්‍ය කම්කරු ඩබ්. ප්‍රභාත් නිශංක, ටී.ජී. රොෂාන් රවීන්ද්‍රනාත්, මුරකරු කේ.ඩී. මහේෂ් තිලකරත්න, රියදුරු ඩබ්. ජානක ප්‍රසාද් යන සේවකයින් බඳවාගෙන ඇත. පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය අනුව ලබාගත් අංක 1/3/6/3 හා 2022.02.19 දිනැති ලිපිය අනුව අනියම් පදනමින් බර උපකරණ ක්‍රියාකරු ටී.එස්. සමරසිංහ දිසානායක යන සේවකයා බඳවාගෙන ඇත. එසේම පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය අනුව ලබාගත් අංක 1/3/6/3 හා 2020.07.08, 2022.03.02 දිනැති ලිපි අනුව සෞඛ්‍ය කම්කරු එච්.ටී. සමීර උදයංග, එම්.ඩී. නුවන් මධුශංක යන සේවකයින් ද බඳවාගෙන ඇත. ඔවුන්ගේ සේවා කාලය සේවා අවශ්‍යතාවය මත සභාව විසින් තීරණය කරනු ලබන කාලයකට සේවයේ යොදවා ගැනීමට පළාත් පාලන කොමසාරිස් විසින් අනුමැතිය ලබාදී ඇත. සභාවේ පවතින සේවා අවශ්‍යතාවය මත ඔවුන් දැනට නිරත වන රාජකාරී වල සේවයේ යෙදවීම තවදුරටත් අත්‍යාවශ්‍ය බව කාර්ය මණ්ඩලය සමාලෝචනයේදී නිරීක්ෂණය වී ඇත. එමෙන්ම අධීක්ෂණ නිලධාරීන් විසින් ඔවුන්ගේ සේවය ඇගයීමට ද ලක්කර ඇති බව හා වර්තමානයේ රටේ පවතින ආර්ථික හා මූල්‍ය අර්බුද හමුවේ රජයේ සියලු බඳවාගැනීම් තාවකාලිකව 2019 වසරේ සිට මේ දක්වා අත්හිටුවා ඇත. බල ප්‍රදේශයේ සිදුවන නාගරීකරණය සමඟ ඇතිවන ජනාකීර්ණ බව හේතුවෙන් එකතුවන අපද්‍රව්‍ය කළමනාකරණය

කරගැනීම සඳහා සේවා අවශ්‍යතාවය ඉහල නමුත්, පුරප්පාඩු සම්පූර්ණ කිරීම හෝ අලුතින් කාර්ය මණ්ඩලය වැඩිකිරීමක් සම්බන්ධව රජයෙන් වැඩපිළිවෙලක් නොමැත. බහුකාර්ය සංවර්ධන බලකාය මගින් බඳවාගන්නා ලද සේවකයන් මෙම ආයතන වලට අනුයුක්ත කළද, සෞඛ්‍ය කම්කරු තනතුරුවල රාජකාරිවල නිරත වීමට ඔවුන් මැලිකමක් දක්වයි. එම නිසා උක්ත නම් සඳහන් සේවකයන් හා සභාවේ දැනට ලියාපදිංචි සෞඛ්‍ය කම්කරුවන් ලෙස සේවයේ නියුතු සනත් විජයකුමාර සහ ලහිරු ප්‍රියනාත් රජපක්ෂගේ සේවය ද දීර්ඝ කාලීනව සේවයේ යොදවාගෙන පවතින සේවා අවශ්‍යතාවය සම්පූර්ණ කරගත හැකිය.

ඒ අනුව උක්ත නම් සඳහන් සේවකයින්ගේ සේවය දීර්ඝ කාලීනව ලබාගැනීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.ජී. සුරංග පුෂ්පකුමාර මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩබ්.එම්. රණතුංග මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.15 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2023.02.08 දිනැතිව, වලස්මුල්ල නගරයේ පොදු වැසිකිළිය අසල මාළු වෙළඳසැලට ජලය ලබාගැනීමට අදාල ඇස්තමේන්තුව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. ඒ අනුව එහි ඇස්තමේන්තු මුදල රු. 85270.50 ක විශාල මුදලක් වන අතර, එම නිසා නව ජල සම්බන්ධතාවය ලබාගැනීමට වඩා වැසිකිළි පද්ධතියට ලබාගෙන ඇති ජල මීටරය හරහා වෙනත් මීටරයක් සවි කරමින් මාළු වෙළඳසැලට ජලය ලබාදීම වාසිදායක වේ.

එම නිසා නව ජල සම්බන්ධතාවයට මුදල් නොගෙවා පවතින ජලනල පද්ධතියට නව මීටරයක් සවිකිරීම සුදුසු බවට ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී පද්මල් රුබසිංහ මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමාගේ ස්තුති කතාව :-**

ගරු සභාපතිතුමා විසින් අද දින රැස්වීමට පැමිණි ගරු උප සභාපතිතුමා, මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය ඇතුලු කාර්යාලයේ නිලධාරී මණ්ඩලයටත්, මාධ්‍යවේදී මහතාටත්, සංග්‍රහ කිරීමට පැමිණි සියලු දෙනාටමත්, ස්තුතිය පුද කරමින් සභාවේ කටයුතු නිමා කරන ලදී.

**විසිර යාම :-**

පෙ.ව. 11.45 ට පමණ සභාවේ කටයුතු නිමාවූයෙන් සභා තොමෝ සතුටින් විසිර ගියහ.

පියසේන ලියනආරච්චි
සභාපති
වීරකැටිය ප්‍රාදේශීය සභාව

පියසේන ලියනආරච්චි
සභාපති
ප්‍රාදේශීය සභාව - වීරකැටිය

2023.02.16 දින,
වීරකැටිය ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරයේදිය.

පිටපත් :-

1. පළාත් පාලන කොමසාරිස්තුමා
2. පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා
3. විගණන උප කාර්යාලය, හම්බන්තොට
4. මහජන පුස්තකාලය, වීරකැටිය